
# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

## METH SAVIYA NEWS LETTER


❖ සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව ❖ 2010 පෙබරවාරි ❖ මෙත් සවිය අටවන කාණ්ඩය ❖ දහහතරවන කලාපය



නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙන් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ - 06
දු.ක: 0714 014467 දුක/ෆැක්ස්: 011 2505088 වෙබ් අඩවිය: www.methsaviya.org විද්‍යුත් තැපෑල: office@methsaviya.org

# නාගද්වීපය



ලංකාවේ උතුරු කෙළවරේ පිහිටි නාගද්වීපය නමින් හැඳින්වුනු කොටසේ එවකට බහුල වශයෙන් නාග ගෝත්‍රිකයෝ වාසය කළහ. ඔවුන්ගේ ජන ප්‍රධානින් වශයෙන් සිටි චූලෝදර, මහෝදර යන දෙදෙනෙකු අතර මිණිපළගක අයිතිය අරභයා භයානක යුද්ධයක් හට ගැනිණි. එය බුදුරජානන් වහන්සේ බුද්ධත්වයෙන් පස්වැනි වස උදා වූ බක් මාසය විය. එම මස අමාවක් දිනයේ බුදුරජානන් වහන්සේ මෙම යුද්ධ භූමියට වැඩම කළ සේක. ඔවුනට කරුණු පැහැදිලි කල බුදුරජානන් වහන්සේ යුද්ධයෙන් නිකරුණේ මහා මිනිස් ඝාතනයක් විය හැකි බව පෙන්වා දුන්හ. සෙන්පතියෝ බුදු වදනෙහි පිහිටමින් සමගිව යුද්ධය නවතා ලූහ. එපමණක් නොව, එම මැණික් ආසනය ද බුදුරජානන් වහන්සේට වැඩ හිඳීම සඳහා පූජා කළහ. එහි වැඩ හුන් බුදුරජානන් වහන්සේ ඔවුනට ධර්ම දේශනා කර වදාළහ.

මෙම ධර්මදේශනාව ශ්‍රවණය කළ මණිඅක්ඛිත නම් නා රජතුමා ධර්මයෙහි පැහැද බෞද්ධ උපාසකයකු බවට පත්විය. බුදුරජානන් වහන්සේට නමස්කාර කළ ඔහු තම වාස භූමිය වූ කැළණියට ද වැඩම කරන ලෙස බුදුරජානන් වහන්සේට ආරාධනයක් කළේය. ආරාධනය පිළිගත් බව හැඟ වූ බුදුරජානන් වහන්සේ එම මැණික් ආසනය පූජා පිණිස එම ජනතාවට ම පවරා දී ආපසු ජේතවනාරායට වැඩම කල සේක.

<u>නාගද්වීප චෛත්‍යය වැඳීමේ ගාථාව</u>

භගිනිසුතමාතුලෙහි දින්නෙ
මණිපල්ලඞ්කවරෙ යහිං නිසින්නො
මුණි ධම්ම ම දෙසෙයි මුනිනං
සිරසා තං පණමාමි නාගදිපං

**මෙහි භාවය**

යම් තැනෙක්හි මාතුල භාගිණෙය්‍ය දෙදෙනා විසින් දෙන ලද උතුම් වූ මිණිපළඟෙහි වැඩහිඳ සර්වඥයන් වහන්සේ භික්ෂූන්හට ධර්ම දේශනා කළ සේක් ද; පාරිභෝගික ධාතුවක් වූ ඒ උත්කෘෂ්ට මාණික්‍යපර්‍යඞ්කය පිහිටුවා ස්ථාපිත කරන ලද නාගද්වීප චෛත්‍යය මස්තකයෙන් නමස්කාර කරමි.

## 2010 අප්‍රේල් 2-3 (පිටත්වීම 1 දා රාත්‍රී)
## යාපනය-නාගද්වීපය සඳහම් චාරිකාව

සඳහම් චාරිකාව පිලිබඳ වැඩිවිස්තර සඳහා 6 වන පිට බලන්න



**බුද්ධත්වයෙන් 5 වන වස, බක් මස අමාවකදා බුදු පහස ලත් නාගද්වීපය**



මෙත් සවිය මගින් නාගද්වීප විහාරයේ වැසිකිළි තැනිමට යෝජිත ස්ථානය ( නිවාඩු දිනයන්හිදී දස දහස ඉක්මවා පැමිනෙන බැතිමතුන් සඳහා දැනට ඇති කුඩා වැසිකිළිය පසෙකින් දැක්වේ.)



දැනට ඇති ලටර් 500 කුඩා ජල ටැංකිය වෙනුවට මෙත් සවිය මගින් ලිටර 2000 හා ලිටර 1000 ටැංකි දෙකක් නාගද්වීප විහාරාධිපති නවඳගල පදුම කිත්ති තිස්ස නායක ස්වාමින් වහන්සේගේ උපදෙස් මත සවිකිරීමට බලාපොරොත්තු වේ.



# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය



ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ - 06
දු.ක: 0714 014467 දුක/ෆැක්ස්: 011 2505088 වෙබ් අඩවිය: www.methsaviya.org විද්‍යුත් තැපෑල: office@methsaviya.org

### අප ගැන වචනයක්...

මෙත් සවිය සංසදය නිරවුල් මනසක් ඇති වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් අරඹන ලද සාමාජිකයන්ගේ එකතුවකි. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයන් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මෙමගින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයන්ගේ කැමැත්ත/ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරණය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වැනි ඒ ඒ කාල වලදී පවත්වන වැඩසටහන් සඳහා සහභාගී වීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයන්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයන්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක් දන-සීල-භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයන් මාංශ භක්ෂනයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

### මෙත් සවිය - විධායක කමිටුව 2009

ගරු අනුශාසකවරු
ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත
වංසාලංකාර අතිපූජ්‍ය
අහංගම ආනන්ද මහා සථිවිරයන්
වහන්සේ

භාවනා කම්මට්ඨානාචාර්ය අතිපූජ්‍ය
මඩවල උපාලි මහා සථිවිරයන්
වහන්සේ

ගරු සභාපති
විද්‍යා කීර්ති, ශාසනදීපන, ලෝකාර්ථචාරි,
විද්‍යාවාචස්පති දේශමාන්‍ය,විශ්ව විද්‍යා
අධිමානසික විද්‍යාවේදී,නාලන්දා කීර්ති ශ්‍රී
ආචාර්ය චන්දන ජයරත්න මහතා

ගරු උප සභාපතිවරු
ඉංජිනේරු සරත් ඉලංගන්තිලක මහතා
නිහාල් මෙන්ඩිස් මහතා

ගරු සම ලේකම්වරු
තුසිත දොඹගොඩ මහතා
චමින්ද බලවෙදගේ මහතා

ගරු භාණ්ඩාගාරික
වාසනා රණසිංහ මහතා

ගරු උප භාණ්ඩාගාරික
ජනක සුවඳරත්න මහතා

සංස්කාරක
සෙනරත් බණ්ඩාර බුළුමුල්ල මහතා

පරිගණක සංස්කාරක සහ
වෙබ් අඩවි කළමණාකරු
චමිල ප්‍රසන්න මහතා

ගරු කාරක සභිකවරු

නාලක එදිරිසිංහ මහතා
පී. සූරියආරච්චි මහතා
සුසන්ත යාපා මහතා
රංජිත් සොයිසා මහතා
එස්.කේ.කළුබෝවිල මහතා
බංදු අබේරත්න මහතා

## සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

### 18 වන චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන

18 වන වැඩසටහන සඳහා අයදුම්පත් භාර ගැනීම අවසන් වී ඇත. මීළග 19 වන වැඩසටහන 2010 ජුනි මාසයේදී ඇරඹීමට නියමිත බැවින් ඒ සඳහා අයදුම්පත් ( 10 වෙනි පිටුව බලන්න, වෙබ් අඩවියෙන්ද ලබාගත හැක.) 10.05.2010 දිනට පෙර කාර්යාලයට ලැබීමට සලස්වන්න.

### 2010-02-07 මෙත් සවිය වාර්ෂික මහා සභා රැස්වීම ධර්ම දේශනාව හා මෛත්‍රීභූෂණ සම්මාන උලෙළ

මෙදින ප.ව. 2.00 - 5.00 දක්වා මෛත්‍රීභූෂණ සම්මාන උලෙළ ද (විස්තර සඳහා ඇතුළු 5වන පිට බලන්න.), ප.ව 3.30 - 4.30 දක්වා සුප්‍රකට ධර්ම දේශකයානන් වහන්සේ නමක් වන අංක 487/25 තිඹිරිගස්යාය පාර කොළඹ - 05 ස්ථානයේ පිහිටි පට්ඨාන ධර්ම සභාවේ භාවනා කම්මට්ඨානාචාර්ය අතිපූජ්‍ය කොරතොට වෙස්සභූ ස්වාමීන්ද්‍රයන් වහන්සෙගේ ධර්මදේශනාවක් ද පැවැත්වේ.

මෙත් සවිය පස්වන වාර්ෂික මහා සභා රැස්වීම, 2009 අයවැය ඉදිරිපත් කිරීම හා නව නිලධාරී මණ්ඩලය පත්කර ගැනීම 2010 පෙබරවාරි 07 වැනි ඉරු දින ප.ව. 4.30 ට පැවැත්වේ. න්‍යාය පත්‍රය සඳහා 5 වන පිට බලන්න. සමරු තිලිනය ඇතුළුවන විට ලබාගන්න.

### 2010 අප්‍රේල් 2-3 යාපනය-නාගද්වීපය සඳහම් චාරිකාව (පිටත්වීම 1 දා රත්‍රී)

විස්තර සඳහා 2 සහ 6 පිටු බලන්න. බස් රථ වල ආසන වෙන් කර ගන්නා අවසාන දිනය 2010 පෙබරවාරි 28 වේ.

### 2010 මෙත් සවිය දින දර්ශනය

අභයගිරිය චෛත්‍යරාජයාන් වහන්සේගේ ඡායාරූපය සහිත 2010 මෙත් සවිය දින දර්ශනය මෙතෙක් නොලැබුන සාමාජිකයින් හට 2010.02.07 දින මහා සභා රැස්වීමදී හෝ කාර්යාලයෙන් හෝ ලබාගත හැකිය.

### 2010.03.07 සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත්වන ක්‍රම පිළිබඳ වැඩ මුළුව.

මෙදින මාසික රැස්වීම වෙනුවට වසරකට වරක් පවත්වනු ලබන ඉහත වැඩ සටහන බොරැල්ල Y.M.B.A ශාලාවේදී ප.ව 1.00 සිට 5.00 දක්වා පැවැත්වේ, පාඩම් කිරීමේ නවීන ක්‍රම, වේගයෙන් ලිවීමේ හා කියවීමේ ක්‍රමවේද, සටහන් ලිවීමේ ක්‍රමවේද, ඉගෙනීමට බාදාවන මානසික රෝග ශඳුනා ගැනීම, මතකය වර්ධනය සඳහා ක්‍රියා මාර්ග බුද්ධි වර්ධන අභ්‍යාස, කාලසටහන් තැනීම ස්වයං යෝජනා ක්‍රම හා විභාගයකදී පිළිතුරු ලියන පිළිවෙල යනාදී වැදගත් කරුණු රාශියකින් සමන්විත වන මෙම වැඩ සටහනට මෙත් සවිය සාමාජිකයින්........

හට හා ඔවුන්ගේ දරුවන් හට නොමිළයේ සහභාගි විය හැක. ( සාමාජික නොවන ඕනෑම වැඩිහිටි කෙනෙකුට හෝ පාසැල් සිසුනටද මේ සඳහා සහභාගි විය හැකිමුත් සපයනු ලබන මුද්‍රිත ද්‍රව්‍ය හා ශාලා ගාස්තු සඳහා යන බර පැන පියවීම සඳහා රු. 500/- ක ආයෝජනයක් කලයුතු වේ. ) උපතේ සිට මරණය දක්වා නොකඩවා සිදුකරනු ලබන ක්‍රියාවලියවන් වන ඉගෙනිම නිසි පරිදි සිදුකරන අන්දම පිළිබඳ වැඩිහිටි හා ළමා සියළු දෙනාහට වැදගත්වන මෙම වැඩමුළුවට සහභාගිවන සාමාජික හා සාමාජික නොවන සියළු දෙනා ශාලාවේ ආසන වෙන්කරගැනිම පිණිස දු,ක.-2505088 හෝ 0714014467 මගින් 2010-02-28 දිනට පෙර පරිපාලන නිළධාරි සුරියආරච්චි මහතා අමතන්න.

## පළමුවෙනි ඉරුදින මාසික රැස්වීම්

සෑම මසකම පළමුවෙනි ඉරුදින සිරිත් පරිදි අනිවාර්යයෙන්ම (දාන-සිල-භාවනා වැඩසටහන් සඳහා සඳහම් චාරිකාවේ නොයෙදෙන දින වලදී) මාසික රැස්වීම් සහ විශේෂ දේශනය කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවෙෂි බෞද්ධ ආශ්‍රමයේ දී පැවැත්වේ. එහෙයින් දැන්වීමක් ලැබුනද නොලැබුනද සෑම මසකම පළමුවන ඉරුදින ( සදහම් චාරිකාවල යෙදෙන දින වලදී හැර ) ඉහත මාසික රැස්වීම් වැඩ සටහහන් සඳහා ප.ව. 2.00 - 4.00 අතර කාලය තුල පැමිණෙන ලෙස සියලු සාමාජිකයින්ගෙන් මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටින්නෙමු. ඉදිරි වැඩ සටහන් පිළිබඳ තොරතුරු (www.methsaviya.org) වෙබ් අඩවියෙන්ද ලබාගත හැක. මෙම වැඩ සටහන සඳහා දිවයිනෙහි සුප්‍රසිද්ධ ධර්මදේශක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වැඩම කරවීම හෝ පෞරෂ වර්ධනය, යෝග වැඩසටහන් ආදි විශේෂිත වැඩසටහක් හඳුන්වාදීම සඳහා ගිහි භවතකු හට හෝආරාධනා කරනු ලැබේ. මේ සඳහා වන සාමාජිකයින්ගේ යෝජනා වෙතොත් සභාපති / ලේකම් තුමා වෙත දන්වන්න.

## මෙත් සවිය ප්ලාස්ටික් හැඳුනුම්පත

ඡායාරූප වලට පෙනී සිටි මෙතෙක් ප්ලාස්ටික් හැඳුනුම්පත් නොගත් සාමාජිකයිනට එවා කාර්යාලයයෙන් ලබාගත්නා ලෙස ඉල්ලා සිටිමු.

## සාමාජිකත්වය අළුත් කිරිම

සාමාජික පත්‍රයේ සඳහන් සාමාජිකත්වය වලංගු සීමාවේ දිනයට පෙර සාමාජිකත්වය අළුත් කර ගැනිමෙන් මෙත් සවිය සවිමත් කර ඉදිරි පුණ්‍ය කටයුතු කරගෙන යෑමට දායක වන ලෙස මෙත් සිත් පෙරදැරිව මතක් කරමු. ඒ සඳහා කාර්යාලයට පැමිණිම අත්‍යාවශ්‍ය නොවන අතර, ඒ වෙනුවෙන් ගෙවිය යුතු රු. 500/= ක වාර්ෂික සාමාජික ගාස්තුව මෙත් සවිය නමින් ලියන ලද රේඛණය කල චෙක්පතක් හෝ ගෙවන කාර්යාලය, “වැල්ලවත්ත” ලෙස සටහන් කල මෙත්සවිය නමට එවන සාමාන්‍ය මුදල් ඇණවුමක් තම ලිපිනය ලියූ රු. 30/=ක මුද්දර කවරයක් හා පැරණි සාමාජික පත්‍රයද සමග ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ 06 වෙත එවීමෙන් අලුත් සාමාජික පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් ලබා ගත හැකි බවද කාරුණිකව දන්වමු.

## සාමාජිකයින් සඳහා සහ සාමාජිකයන්ගේ පවුල්වල අය සඳහා නොමිළයේ ඇස් පරීක්ෂාව හා ඇස්කණ්නාඩි ලබාදීම

ඉදිරියේදී පැවැත්වීමට නියමිත ඉහත වැඩ සටහන සඳහා කණ්නාඩි කිහිපයක් හෝ ලබාදී දායක වීමට කැමැති පිංවතුන් වෙත්නම් සභාපතිතුමා / ලේකම්තුමා වෙත දැනුම් දෙන්න.

## මෙත් සවිය නොමිළයේ නීති උපදෙස් සේවය.

සාමාජිකයින් සඳහා අවශ්‍ය නිති උපදෙස් කෙටි වශයෙන් දුරකථන මගින් හෝ මසකට වරක් හමුවී හෝ ලබාදිමට කැමති සාමාජික නිතිඥ මහත්ම මහත්මීන් වෙතොත් කරුණාකර සභාපතිතුමා වෙත / ලේකම්තුමා වෙත හෝ කාර්යාලයට දන්වන්න.

## පූජාභූමි වල පානීය ජල ටැංකි සවිකිරීම /පැන් පහසුකම් තැනීමේ ව්‍යාපෘතිය

පූජනිය සිද්ධස්ථානවල ස්වාමීන්වහන්සේලාට හා වන්දනාකරුවන් සඳහා මෙත්සවිය මගින් පැන් පහසුකම් සඳහා ජල ටැංකි /ජල නල / කරාම ආදිය සවිකර දීමේ සද්කාර්යයක් අරඹා ඇත. ඔබගේ නමද සටහන්ව මෙම ටැංකි අනුරාධපුරය / පොළොන්නරුව වැනි ස්ථානවල පමනක් නොව අවශ්‍ය වෙනත් සිද්ධස්ථාන වලද පවා තනා එම සිද්ධස්ථාන වලට එන පිංවතුන්ගේ පවස නිවීම ට කැමැති සාමාජිකයන් වෙතොත් තම කැමැත්ත සභාපතිතුමාට/ලේකම්තුමාට හෝ කාර්යාලයට දන්වන්න. අවශ්‍ය විටදී අප ඔබව අමතන්නෙමු. මේ සඳහා රු 10000/- 30000/- දක්වා (ස්ථානය මත වෙනස් වේ.) වියදමක් දැරීමට සිදුවිය හැක. තනිව හෝ කිහිපදෙනෙකු එක්වද මේ සඳහා දායක විය හැක.
පැන් පහසුකම් අවශ්‍ය සුදුසු සිද්ධස්ථාන වෙතොත් අප

## සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග

සංසදයේ ලිපි ගනුදෙනු කටයුතු සදහා මුද්දර ගාස්තුව ලෙස විශාල මුදලක් වැයකිරීමට සිදුවී ඇති අතර, මෙම සද්කාරය සදහා මුද්දර පරිත්‍යාග කිරීමට කැමති පිංවතුන් හට රු. 5/= මුද්දර කැමති ප්‍රමාණයක් පරිත්‍යාග කල හැකිය. ලබා දෙන මුද්දර ප්‍රමාණය ඒ සදහා ඇති ලේඛනයේ සටහන් කරනු ලැබේ. මුද්දර 10 ට වැඩි ඕනෑම ප්‍රමාණයක් පරිත්‍යාග කරන විට සටහන් පොතට ඇතුල් කරනු ලැබේ. මෙත්සවිය සංසදයේ පැවැත්මට හා එහි වර්ධනය සදහා ඔබගේ ශාසනාලයැති දායකත්වය අගය කරන්නෙමු.

**මීළඟ 19 වන චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන 2010 ජූනි මාසයේදී ඇරඹීමට නියමිත අතර ඒ සඳහා අයදුම්පත් 2010.05.10 දිනට පෙර කාර්යාලයට ලැබීමට සලස්වන්න.**

# මෙත් සවිය

පස්වන මහ සමුළුව

සහ

මෛත්‍රී භූෂණ උපහාර

ප්‍රදානෝත්සවය

## න්‍යාය පත්‍රය

පස්වරු

2.00 - සාමාජිකයින්ගේ පැමිණීම.

2.30 - ගරුතර මහා සංඝරත්නය වැඩම කරවීම.
- අමුත්තන් පිළිගැනීම සහ කැඳවාගෙන ඒම.

2.40 - පොල්තෙල් පහන දැල්වීම.

2.45 - ජාතික ගීය.
මුලසුන හෙබවීම : ශ්‍රී ධර්ම රක්‍ෂිත අමරපුර මහානිකායේ මහානායක ධුරන්දර රාජකීය පණ්ඩිත වැලිගම ශ්‍රී ඤාණරතන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

2.50 - මල්/ පහන් පුද
ආජීව අෂ්ඨමක සීලය සමාදන් වීම.
මෙත් සවිය තේමා පාඨය කියවීම.
- පිළිගැනීමේ කථාව (මෙත් සවිය සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා)

3.00 - අතිපූජ්‍ය අහංගම ආනන්ද නාහිමිපාණන් වහන්සේගේ උපහාර සම්මානය වෙනුවෙන් හේතුපාඨ කියවීම සහ සම්මානය පිරිනැමීම.

3.05 - වෛද්‍ය ඇල්බඩ සුනිල් ලියනගේ මහතාගේ උපහාර සම්මානය වෙනුවෙන් හේතුපාඨ කියවීම සහ සම්මානය පිරිනැමීම.

3.10 - අතිපූජ්‍ය අහංගම ආනන්ද නාහිමිපාණන්ගේ කෙටි දේශනාව.

3.15 - වෛද්‍ය ඇල්බඩ සුනිල් ලියනගේ මහතාගේ කෙටි දේශනය.

3.20 - ස්තුති කථාව (මෙත් සවිය ලේකම් තුසිත දෙඹගොඩ මහතා).

3.25 - තේ පැන් සංග්‍රහය සහ උපහාර ප්‍රදානෝත්සවයේ නිමාව.

3.30 - කොළඹ-05 පට්ඨාන ධර්ම සභාවේ භාවනා කම්මට්ඨානාචාර්ය අතිපූජ්‍ය කොරතොට වෙස්සභූ ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් පවත්වනු ලබන ධර්ම දේශනාව.

4.30 - <u>මහා සමුළුව</u>
වාර්ෂික වාර්තාව, වාර්ෂික අය-වැය වාර්තාව, නව නිලධාරි මණ්ඩලය පත්කරගැනීම, විගණකාධිවරයකු පත්කර ගැනීම.

5.00 - වැඩසටහන් නිමාව.

*මෙවර මෛත්‍රී භූෂණ උපහාර සම්මාන පිරිනැමෙනුයේ විශ්වකීර්ති ශ්‍රී, සාහිත්‍ය විශාරද, රාජකීය පණ්ඩිත, ශ්‍රී ප්‍රඥාලෝකාභිමාන, ශාසන ශෝභන, ශ්‍රී ධර්මරක්ෂිත වංශාලකාර සද්ධර්මකීර්ති ශ්‍රී සමාජ සේවා විභූෂණ. අහංගම ආනන්ද ගරු නාහිමිපාණන් හට සහ වෛද්‍ය ඇල්බඩ සුනිල් ලියනගේ මැතිඳුනට ය. ඒ සඳහා හේතුපාඨ මෙසේය...*

සිද්ධි රස්තු !

මෙත්සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ඨ සේවය හා ප්‍රවීනතාවය උදෙසා පිරිනැමෙන
සිරි ලක බුදු සසුන වචා-වඩාලනුව මුළු සිතින් කැප වෙමින්, වැල්ලවත්තේ සිරි විජයාරාමය අසරණ සරණ සේවාවේ මුදුන් මල් කඩ කොට, ගිලනුනට ද, දුගී අසරණයනට ද පිහිට වීම සිය පැවිදි දිවියෙහි පරම අරුත කොටගනිමින්, 'සබ්බේ භායන්ති මච්චුනෝ' යන ලොවුතුරු බුදු වදනට එක් හදින් කැපවී මරණයේ දෙරටුව අබියසැ සිටුනා අසරණ සතුන් සුවහස් ගණනකට නැවැත දිවි වරම උද කැර දීමෙහි ලා අසම රන් මෙහෙවරක් ඉටු කරන
විශ්වකීර්ති ශ්‍රී, සාහිත්‍ය විශාරද, රාජකීය පණ්ඩිත, ශ්‍රී ප්‍රඥාලෝකාභිමාන, ශාසන ශෝභන, ශ්‍රී ධර්මරක්ෂිත වංශාලකාර සද්ධර්මකීර්ති ශ්‍රී සමාජ සේවා විභූෂණ,
අහංගම ආනන්ද ගරු නාහිමිපාණන් හට
මෙත් සවියෙන් මෙසේ ගරු උපහාර සම්මානය වන

**'මෛත්‍රී භූෂණ අභය දනපති'**

ගෞරව නාම සම්මානය
සිරි බුදු වසින් 2553 නවම් මස අව නවවක් ලත් රිවි දින හෙවත් වැවහර වසරින්
2010 පෙබරවාරි 07 වන ද
කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධර්ම ගවේෂී බෞද්ධාශ්‍රම ශාලාවේදී පැවැත්වෙන
මෙත් සවිය මහ සමුළු උලෙළෙහි දී
හරසරින් පිරිනැමෙන වගයි.

සිද්ධි රස්තු !

මෙත්සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ඨ සේවය හා ප්‍රවීනතාවය උදෙසා පිරිනැමෙන
'සියලු සත්හු සිය දිවිය පිය කරන්නේ ය' යන ලොවුතුරු බුදු වදන් මුදුනින් ගෙන, කුරිරු බිහිසුණු වද හිංසාවලට ගොදුරු කැරෙන ලක්දිව සියලු සතුන් ගේ දිවි අයිතිය උදෙසා නො බා, නො සැලී පෙනී සිටිමින්, සිරි ලක් දිවින් සත්ව හිංසනය මුල්මනින් තුරන් කරනු පිණිස ඒ බඳු රුදුරු හිංසකයනට පෞද්ගලික ව හඬු පවරනු සඳහාත් ඒ හා සබැඳි නීති පණ ගන්වනු සඳහාත් සිය දිවිය වැය කොට අනැගිතම මෙහෙවරක යෙදෙන,
සමස්ත ලංකා ඒකාබද්ධ සත්ත්ව අවිහිංසා මහා සම්මේලනයේ උපසභාපති, ධර්මපාල චින්තන පදනමේ ජාතික සංවිධායක
වෛද්‍ය ඇල්බඩ සුනිල් ලියනගේ මැතිඳුනට
මෙත් සවියෙන් මෙසේ ගරු උපහාර සම්මානය වන

**'මෛත්‍රී භූෂණ අහිංසා සාධක'**

ගෞරව නාම සම්මානය
සිරි බුදු වසින් 2553 නවම් මස අව නවවක් ලත් රිවි දින හෙවත් වැවහර වසරින්
2010 පෙබරවාරි 07 වන ද
කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධර්ම ගවේෂී බෞද්ධාශ්‍රම ශාලාවේදී පැවැත්වෙන
මෙත් සවිය මහ සමුළු උලෙළෙහි දී
හරසරින් පිරිනැමෙන වගයි.

# මෙත් සවිය සඳහම් චාරිකාව යාපනය - නාගදීපය

මෙවර මෙත්සවිය සඳහම් චාරිකාව සිදු කරනුයේ යුද්ධය නිමා වීමෙන් පසු බොහෝ දෙනා හට වන්දනාමාන කිරීමට අවශ්‍යව තිබූ බුදු පහස ලත් නාගද්වීපයටය.

ගමන සඳහා සුඛෝපභෝගී බස්රථ 5-6 යොදා ගැනේ.

වැඩසටහන් විස්තරය සැකැවින් පහත පරිදිය

**2010.04.01 බ්‍රහස්පතින්දා**

රාත්‍රී 10.00 - වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයෙන් පිටත්වීම.

**2010.04.02 සිකුරාදා**

පෙ.ව. 6.00 - බස් රථය තුලදී හෝ මාන්කුලම් මුර පොලේදී උදේ ආහාරය (කරුණාකර ආහාරය සඳහා පළතුරු හෝ කෙටි ආහාර වර්ගයක් නිවසේදී තනා ගෙන පැමිණෙන්න.)

පෙ.ව.10.00- යාපනය නාග විහාරයේ සිරුරුකිස නිමකර ගැනීම පිණිස කෙටිකාලීනව නවාතැන් ගැනීම.

පෙ.ව.11.00- සංඝමිත්තා මහරහත් තෙරණිය ශ්‍රී මහා බෝධි ශාඛාව සමග ලක්දිවට ගොඩබට ස්ථානය -දඹකොල පටුන, රහතුන් වැඩසිටි ස්ථාන, කුඩා දාගැබ්, යාපනය පුස්තකාලය, යාපනය කොටුව, පතුල රහිත ළිඳ නල්ලූර් කෝවිල ආදි ස්ථාන නැරඹීම හා දිවා ආහාරය.

ප.ව.4.00- නාගදීපය කරා පිටත්වීම. (ගොඩින් සහ මුහුදින් යා යුතුය.)

ප.ව.5.30- රාත්‍රී නවාතැන් පහසුකම් නාගද්වීපය තුලය. (පොදු වැසිකිලි; බිම නිදාගැනීම සඳහා අලුත්ම පැදුරක් සහ කොට්ටයක් සපයනු ලැබේ. ඒවා එන විට පූජා කර එන්නෙමු.) අවශ්‍ය අයහට මුහුදේ ස්නානයට අවසර ඇත.

ප.ව. 7.00 - රාත්‍රී කප්රුක් පූජාව (පේසාලය අඩි 72 කි), සමූහ භාවනාව, ගිලන්පස පූජාව, පට්ඨාන පූජාව හා අවශ්‍ය කිරි පිඩු පූජාව යනාදිය. (මේ පිං කටයුත්ත සඳහා ඔබට දායක විය හැක. කාර්යාලයෙන් විමසන්න.)

**2010.04.03 සෙනසුරාදා**

පෙ.ව.7.00- උදෑසන ආහාරය, නාගදීප විහාරයට ජල ටැංකි, වැසිකිලි සහ ආරක්ෂිත වැට පූජා කිරීම. (මේ සඳහා පින්වතුන්ට දායක විය හැක. කාර්යාලයෙන් විමසන්න. කොල පැහැති (උස අඩි.6) දැල් මීටරයක් රුපියල් 500.00 ත් 600.00 ත් අතර වේ.)

පෙ.ව. 9.30- නාගදීපයෙන් පිටත්වීම.

පෙ.ව.11.00- රෝග සුවයට ස්නානය කරන පෙන්නාල පොකුන, ඇතුළු යාපනයෙ වැදගත් ස්ථාන නැරඹීම. සාප්පු සවාරිය.

ප.ව. 2.00- දිවා ආහාරය සැපයීම නාග විහාරයේදී.

ප.ව. 3.00- යාපනය නගරයෙන් පිටත්වීම. ඒ 9 මාර්ගයේ පැමිණෙන අතර යුද්ධය ජයග්‍රහණය කල ස්ථාන හා වෙනත් ස්ථාන වල බස් රථය නවත්වනු ඇත.

ප.ව. 8.00 - රාත්‍රී ආහාරය මිහින්තලයේදී.

**2010.04.02 - ඉරිදා**

පෙ.ව.5.00- කොළඹ 5 ශ්‍රී විජායාරාමයට නැවත පැමිණීම. (පෙ.ව. 4.00 - 5.00 අතර)

මෙම සඳහම් චාරිකාව සඳහා බස් ගාස්තු පමණක් පියවීමට එක් අයෙකු සඳහා රු. 2500.00 ක් වැය වන අතර නවාතැන් සඳහා බරපැන, පැදුරු කොට්ට සැපයීම, 2 දා අළුයම හැර සෙසු සියළු ආහාර සැපයීම, පානීය ජලය සැපයීම ආදිය සඳහා දානපතීන්ගෙන් ලැබෙන්නා වූ ආධාර කොටස් ද සැළකිල්ලට ගෙන රු. 1000.00 ක අවම මුදලක් එක් අයෙකු හට දැරීමට සිදු වේ. (එනම් මුළු බරපැන රු. 3500.00 කි).

මේ සඳහා බස් රථ වල ආසන වෙන්කරවා ගැනීම 2010 පෙබරවාරි 28 ට පෙර මෙත්සවිය කාර්යාලයට මුදල් ගෙවා සිදු කර ගන්නා ලෙසද ඉඩ කඩ සීමාසහිත බවද මෙයින් මතක් කර සිටිමු.

චාරිකාවට සහභාගිවිය හැක්කේ මෙත්සවියේ සාමාජිකයන්ට හා ඔවුන්ගේ ළඟම ඥාතීන්ට පමණි. (හිත මිත්‍රාදීන් හා දුර ඥාතීන් රැගෙන ඒමෙන් වලකින ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු. චාරිකාවේදී මුහුදින් බෝට්ටු ආදියේද යාමට ඇති බැවින් කුඩා ළමුන් හා වයසක අය රැගෙන ඒමෙන් ද

## බුදුරජානන් වහන්සේ ලංකාවට වැඩම කල අවස්ථා තුන....

01. බුදුරජානන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමන සිදු වුයේ බුද්ධත්වයෙන් නවවැනි මස දුරුතු පුර පසළොස්වක පොහෝ දිනය. එසේ වැඩමවන ලද්දේ යක්ෂ ගෝත්‍රිකයන්ගේ මහා රැස්වීමක් තිබූ මහියංගනයටය.

02. බුද්ධත්වයෙන් පස්වැනි වර්ෂයේ බක් මස අමාවක් දින නාගද්වීපයේ චූලෝදර, මහෝදර නා රජුන්ගේ යුද්ධය සමථයකට පත් කරනු වස් බුදුරජානන් වහන්සේ දෙවන වර ලංකාවට වැඩමකළ සේක.

03. මණිඅක්ඛිත නා රජුගේ ආරාධනය ඉටුකරනු වස් බුද්ධත්වයෙන් අටවැනි වස වෙසක් පුර පසළොස්වක පොහෝ දින බුදුරජානන් වහන්සේ කැළණියට වැඩම කළහ. එය බුදුරජානන් වහන්සේගේ තුන්වැනි ලංකා ගමන වන අතර, එම ගමනේ දී කැලණිය, ශ්‍රීපාද ස්ථානය, දිවා ගුහාව, දීඝවාපිය, ශ්‍රී මහාබෝධීන් වහන්සේ පිහිටි ස්ථානය රුවන්මැලි සෑය, ථූපාරාමය සේල චෛත්‍යය පිහිටි තැන් වලට ද වැඩමවා ඒ ඒ තැන්හි ස්වල්ප වේලාවක් සමාධි සුවයෙන් වැඩ හුන්හ.

# සාමාජික ලිපි

## දෙලොවම වැඩ සලසන මරණානුස්සති භාවනාව

ඉපදීම සියලු දුකට හේතුවන බැව් බුඬානුශාසනාවයි. මෙම දුක ඇතිවන්නේ සසර නැවත නැවත ඉපදීමෙන් භවය දිග්ගැස්සෙන නිසාය. එහෙයින් කලයුත්තේ නොඉපදීමට සියලු දුක් නැතිකර ගැනීමයි. අප අදහන දහමෙහි නිවන නමින් හඳුන්වන්නේ මෙයයි. මේ නිවාන සැපයක් යැයි හඳුන්වන්නේ එය සංඥා හා වේදනා රහිත වූ සංඥාවේදයිත නිරෝධයක් හෙයිනි.

මරණ-අනු-ස්මෘති වනුයේ මරණානුස්මෘතියයි. ස්මෘති නම් සිහිකිරීමයි. නැවත නැවත සිහිකරනුයේ අනුස්මෘතියයි. මරණය නැවත නැවත සිහිකරනුයේ මරණානුස්මෘතියයි. විශුද්ධි මග්ගයේ සඳහන් පරිදි සතර ආකාර මරණ විස්තරයක් ඇත.

1. <u>ජිවිතේන්ද්‍රියාප්‍ය මරණය</u>(කය සිඳියාමෙන් සිදුවන මරණය).

2. <u>සමුච්ජෙද මරණය</u> (නැවත කොතනකවත් පිළිසිඳ ගැනීමක් නැති රහතන් වහන්සේලා සේ සසර දුකින් මිදීමය.)

3. <u>ක්‍ෂණික මරණ</u> (සංස්කාරයන්ගේ ක්‍ෂණ භංගයයි. උත්පාද ඨිති භංග වශයෙන් වූ ඇතිවීම පැවතිම හා නැතිවීම යන ත්‍රිවිධ ක්‍ෂණ අවස්ථාවයි (බිඳියාමයි). හේතු ප්‍රත්‍යයෙන් උපන් සියළු සංස්කාර ද මෙම ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා වන මරණයට ගොදුරු වේ.

4. <u>සම්මුති මරණ</u> (ගස මැරීම, අල භෝග ශෂ්‍ය මැරීම, ආදි ලෝක සම්මත ව්‍යවහාර මරණයයි.)

මෙම ජිවිතේන්ද්‍රියෝ පච්ජෙද මරණයද දෙවදෑරුම්ය. එනම් කාලමරණ හා අකාල මරණ වශයෙනි. ඉතින් අප කලයුත්තේ කුමක්ද? නැවත නැවතත් ඉපදීම කෙලවරකර ගැනීම නොවේද? කල් නොයවාම දහමෙහි නියැලි සංසාර භවකතරෙන් එතෙරවීමට කටයුතුකර ගැනීමයි. ඒ සඳහා ප්‍රඥාව පහල වේවා!

*මෙත් සවිය සාමාජික : 01 - 109*
*එඩ්වඩ් සමරදිවාකර*

## තුති කුසුම්



මෙත් සවිය සභාපති ආචාර්ය චන්දන ජයරත්න මැතිතුමා වෙත,

2009 සැප්තැම්බර් 27 වන දින සිට 2010 ජනවාරි 24 වන ඉරුදින තෙක් ගෙවුනු මාස හතරට ආසන්න කාලය අප ජිවිතයේ ආලෝකමත්ම කාලය විය. උපන් දා සිට මෙතෙක් කාලයක් උගත් දෙයින් එපිට ජිවිතය නිවැරදිව දැකීම, යහ පැවැත්ම, මෙන්ම නිවැරදි බුදුදහම සහ ධර්මානුකුල ජිවිතය ගැන අවබෝධ කර දීම හා සංසාර ගමන කෙටිකර ගැනීමෙන් නිවනට ලගා වීමට කියා දුන් ඔබතුමාට සහ මෙත් සවිය කාර්ය මණ්ඩලයට අපි හද පතුලෙන්ම ස්තුතිවන්ත වෙමු.
පිං සිදු වේවා !
මෙයට,
*17 වන කණ්ඩායමේ සාමාජිකයන්*
*සා. අංක* 17-2844, 17-2845, 17-2846, 17-2847, 17-2859, 17-2860


# සාර්ථක විවාහ ජීවිතයක් ගෙන යාම සඳහා ඔවදන්

## <u>විශාඛාවට දුන් අවවාද</u>

1. ඇතුලත ගිනි පිටට නොයැවිය යුතුය.
2. පිටත ගිනි ඇතුලට නොගැනිය යුතුය.
3. දෙන්නාට දිය යුතුය.
4. නොදෙන්නාට නොදිය යුතුය.
5. දෙන්නාට ද නොදෙන්නාට ද දිය යුතුය.
6. සුවසේ හිඳිය යුතුය.
7. සුවසේ වැළඳිය යුතුය.
8. සුවසේ නිදිය යුතුය.
9. ගිනි පිළිපැදිය (සැළකිය) යුතුය.
10. ඇතුලත දෙවියන් නැමදිය යුතුය.

විශාඛාවගේ දෙමාපියෝ ධනංජය හා සුමනායි. විශාඛා විවාහ වී පතිකුලයට යාමට සූදානම් ව සිටිය දී ඇයගේ පියා අවවාද දහයක් අයට දුන්නේය. අංගුත්තර නිකාය අට්ඨකථාවෙහි හා ධම්මපදට්ඨකථාවෙහි දැක්වෙන විශාඛා වස්තුවෙහි එම අවවාද පිළිබඳ විස්තර ඉදිරිපත් වී ඇත. පළමුවැනි අවවාදය වන ඇතුළත ගිනි පිටට නොයැවිය යුතුය යන්නෙන් අදහස් වන්නේ කෙනෙකුගේ පවුලට පෞද්ගලික වූ රහසිගත තොරතුරු පිටට දැන ගැනීමට නොසැලසිය යුතු බවයි. පිටත ගිනි ඇතුළට නොගැනිය යුතු යන්නෙන් කියැවෙන්නේ අනුන්ගේ නරක සහ රහස් තොරතුරු ඇතුළට දැනගැනීමට නොසැලැස්විය යුතුය යනුයි. මෙමෙ දෙතැනෙහිදීම ගිනි යන වචන යොදා ඇත්තේ රූපකයක් ලෙසය. මෙබඳු ගිනි වෙනත් ගිනි සමග සැසඳිය නොහැකි යයි සඳහන් වෙයි. "එව රූපානි අග්ගි සදිසො අග්ගි නාම නත්ථි" මෙයින් මෙම ගින්න අනෙක් ගිනිවලට වඩා භයානක බවයි. තෙවැනි අවවාදයෙන් කියැවෙන්නේ තමන්ට සලකන දෙන අයට පමනක් දියයුතු බවයි. යමක් දුන්විට ආපසු තමන්ට නොදෙන අයට නොදිය යුතු බව සිවුවැනි අවවාදයේ අරුතයි. පස්වැනි අවවාදයෙන් කියවෙන දෙන හා නොදෙන අයට දීම යනු දුප්පතුන්ට හා තමන්ගේ දිළිඳු යහළුවන්ට හා නෑදෑයින්ට ඔවුන් දුන්නත් නොදුන්නත් ඔවුන්ට දියයුතු බවයි. සයවැන්න සුවසේ හිඳිය යුතු බවයි. එයින් කියවෙන්නේ ස්වාමියා හා නැදි මයිලන් ඉදිරියේ බිරිඳ වාඩි නොවී සිටගෙන සිටිය යුතු බවයි. නැදිමයිලන් ස්වාමියා හා සේවකයන් ආහාර ගැනීමෙන් පසු බිරිඳ ආහාර ගැනිය යුතු බව සුවසේ වැළඳිය යුතුය යන්නෙන් අදහස් වෙයි. සුවසේ නිදිය යුතුය යනුයෙන් ස්වාමියා නැදිමයිලන් හා සේවකයන් නින්දට ගිය පසු බිරිඳ නිදාගත යුතු බව අදහස් කෙරෙයි. නවවැනි අවවාදයෙන් කියැවෙන ගිනි පිළිපැදිය යුතුය යන්න ස්වාමියා හා නැදිමයිලන් සුද්ධ ගින්න වශයෙන් සලකා ඔවුනට ගරු බුහුමන් සැලකිලි සත්කාර කළයුතු බව හගවයි. දසවැනි අවවාදය වන්නේ ඇතුලත දෙවියන් නැමදිය යුතුය යන්නයි. එහි අදහස ගෙදරට කුලුපග වූ ශ්‍රමණ බ්‍රාහ්මණ වැනි පූජක පක්ෂයට දානමානාදිය දීමෙන් ගරු බුහුමන් කළයුතු බවයි.

# BRAIN DAMAGING HABITS



**1. No Breakfast**
People who do not take breakfast are going to have a lower blood sugar level. This leads to an insufficient supply of nutrients to the brain causing brain degeneration.

**2 . Overeating**
It causes hardening of the brain arteries, leading to a decrease in mental power.

**3. Smoking**
It causes multiple brain shrinkage and may lead to Alzheimer disease.

**4. High Sugar consumption**
Too much sugar will interrupt the absorption of proteins and nutrients causing malnutrition and may interfere with brain development.

**5. Air Pollution**
The brain is the largest oxygen consumer in our body. Inhaling polluted air decreases the supply of oxygen to the brain, bringing about a decrease in brain efficiency.

**6 . Sleep Deprivation**
Sleep allows our brain to rest.. Long term deprivation from sleep will accelerate the death of brain cells..

**7. Head covered while sleeping**
Sleeping with the head covered increases the concentration of carbon dioxide and decrease concentration of oxygen that may lead to brain damaging effects.

**8. Working your brain during illness**
Working hard or studying with sickness may lead to a decrease in effectiveness of the brain as well as damage the brain.

**9. Lacking in stimulating thoughts**
Thinking is the best way to train our brain, lacking in brain stimulation thoughts may cause brain shrinkage.

**10. Talking Rarely**
Intellectual conversations will promote the efficiency of the brain.

# The main causes of liver damage are:

**1. Sleeping too late and waking up too late are main cause.**

**2. Not urinating in the morning.**

**3. Too much eating.**

**4. Skipping breakfast.**


**5. Consuming too much medication.**

**6. Consuming too much preservatives, additives, food coloring, and artificial sweetener.**

**7. Consuming unhealthy cooking oil.**
As much as possible reduce cooking oil use when frying, which includes even the best cooking oils like olive oil. Do not consume fried foods when you are tired, except if the body is very fit.

**8. Consuming raw (old & overly done) foods also add to the burden of liver.**
Veggies should be eaten raw or cooked 3-5 parts. Fried veggies should be finished in one sitting, do not store.

We should prevent this without necessarily spending more. We just have to adopt a good daily lifestyle and eating habits. Maintaining good eating habits and time condition are very important for our bodies to absorb and get rid of unnecessary chemicals according to 'schedule.'



# නිවේදන සහ නොමිළයේ පලකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

## වැදගත්

❖ මෙත් සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපි ද, දාන-ශිල-භාවනා වැඩසටහන් වලදී දායකත්වය දරන පිංවතුන්ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන්ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිළයේ පලකරනු ලැබේ. කොළ කැබැලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

❖ සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තිබිය යුතුය. ඔබගේ ලිපිනය ලියාදීම සඳහා භාවනා වැඩසටහන් වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවලද අංකය සදහන් නොකරන හා වැරදි අංක සඳහන්කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබීයාම පිළිබඳව වග කියනු නොලැබේ.

- සංස්කාරක -

## මෙත්සවිය දුරකථන අංක

**මෙත්සවිය තොරතුරු විමර්ශනය කරනවිට පරිපාලන නිලධාරී මහතා** අමතන්න (011-2505088, 0714-014467). එම දුරකථන වල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි. අපගේ වෙබ් අඩවිය වන www.methsawiya.org මගින්ද තොරතුරු ලබා ගත හැකිය.

**මීට අමතරව සමලේකම් වරුන් වන තුසිත දොඹගොඩ (071-4454411) හා බී. ඩබ්. චමින්ද (077 7790076 )**යන මහතුන් ගේ පුද්ගලික දුරකථන අංකයන් අමතා ද හදිසි තොරතුරු ලබා ගත හැකිය.

**සංසදයේ සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක (0714 800800 හෝ 0777 309385)** මගින් දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක් (ඉතා හදිසි අවශ්‍යතාවයකදී ඕනෑම වේලාවක) සිදුකරන්න. (දිනකට දුරකථන පණිවිඩ 30 ක් පමණ ලැබෙන නිසා සාමාජික අංකය හා නම පවසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## කොළඹ ජාතික රෝහලේ වාට්ටු සඳහා බුදු පිළිම සහ අසරණ රෝගීන් සඳහා අවශ්‍ය මූලික ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම

*වැල්ලවත්තේ ශ්‍රී විජයාරාමාධිපති අහංගම ආනන්ද ස්වාමීන්වහන්සේගේ අනුසාසනා පරිදි පැවැත්වෙන ඉහත සත්කාර්ය සඳහා බුදු පිළිම, සුදු රෙදි, සැත්කම් වලදී අන්දවන ඇඳුම්, දත් බුරුසු හා දන්තාලේපන, තුවා, සුදු හෝ පාට සරම්, ඇඳ පෝච්චි ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමට කැමති පින්වතුන් එම ද්‍රව්‍ය ගරු ස්වාමීන්වහන්සේට හෝ කාර්යාලයට පැමිණ භාරදෙන්න.*

## නොමිළයේ රෝද පුටු සහ කිහිලි කරු ලබා දීම.

මෙත් සවිය මගින් අසරණ අය සඳහා රෝද පුටු සහ කිහිලි කරු පරිත්‍යාග කිරීමේ වැඩපිළිවෙලක් දියත් කර ඇත. රෝද පුටු හෝ කිහිලි කරු අවශ්‍ය අය වෙත්නම් මෙත් සවිය වෙත ලිඛිතව ඉල්ලීමක් සිදු කල යුතුය. මෙම වැඩසටහන සඳහා රෝද පුටු සහ කිහිළි කරු ලබා දී දායක වීමට කැමති පින්වතුන් හට එම උපකරණ මෙත් සවිය වෙත ලැබෙන්නට සලස්වන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.


*වැඩිහිටි දෙමාපියන්ට හා මානසික ආබාදිත අයට නේවාසික පහසුකම්*

**අපි වැඩිහිටියන්ට සලකමු**

**ඩේවිඩ් ජයසුන්දර වැඩිහිටි නිවාසය**

වැඩිහිටි දෙමාපියන් නේවාසික හා දිවා සුරැකුම් ස්ථානය

අංක 721/සී, පන්සල පාර, දළුගම, කොහල්විල, කැලණිය

දු.අ. 011-2912297, 0716246101, 0602162661

E-Mail: jayasundar@sltnet.lk


## ✳ සුව සෙත ✳

ප්‍රාණ/විශ්ව ශක්ති ක්‍රම මගින් සමහර රෝග සඳහා සිත දියුණු කරගත් අය මගින් රෝග සුවයට උපකාර කිරීමේ නොමිළයේ පැවැත්වෙන වැඩසටහන් ඉරු දින වලදී ශ්‍රී විජයාරාමයේ දී ප.ව.12.00-2.00 දක්වා පැවැත්වේ. කාර්යාලයෙන් විමසා පැමිණෙන්න.

## ප්‍රායෝගික අධිමානසික විද්‍යාව හා පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 16 වන වැඩසටහන

2009.02.14 දින පෙ.ව. 10.00 ට අරඹනු ලබන අතර ඒ සඳහා අයදුම්පත් 2009.02.10 දිනට පෙර භාර දෙන්න.

**ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ**


**සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්**

**SIGHT-N~ STYLE OPTOMETRISTS**

නො: 126ඩී, හයිලෙවල් පාර, නුගේගොඩ.

(අනුලා විදුහල ඉදිරිපිට)

දුරකථන: 2854758)

(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න)

මෙ.ස.සාමාජිකා නෙරංජලා කන්නන්ගර මහත්මිය


## පුස්තකාල පොත් හා CD තැටි

ඔබ විසින් ලබාගෙන ඇති මාසයක් ඉක්මවූ පොත් හා CD තැටි කරුණාකර කාර්යාලය වෙත භාර දෙන්න. පුස්තකාල පොත් හා CD තැටි සඳුද අඟහරුවාද හැර කාර්යාලය විවෘතව ඇති සතියේ අන් දින වලදී සාමාජික ඔබහට ලබාගත හැක. පන්ති පැවැත්වෙන ඉරිදා දින වලදී පමණක් පුස්තකාල පොත් ලබා ගැනීම සඳහා ප.ව 1.45 ට පෙර පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමු.

## අසරණ සරණ සහ මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා පිංකැටවල එකතු කල මුදල්

සතුන් නිදහස් කිරීම සඳහා පිං කැටවල එකතු කල මුදල් භාර දීමට කැමති අය මෙත් සවිය කාර්යාලයට එම මුදල් භාර දී පිං පත්‍රිකාවක් ලබා ගන්න.

# මෙත් සවිය මෛත්‍රී සංසදය සාමාජික අයදුම්පත

**(ජායා පිටපත්ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)**

1. සම්පූර්ණ නම ........................................................................................................

2. ස්ත්‍රී / පුරුෂ භාවය................ 3. ජාතික හැඳුනුම්පත් අංකය..........................................................................

(ජායා පිටපතක් අමුණන්න)

4. උපන් දිනය....................... 5. වයස.................. 6. ආගම..........................................................................

7. ස්ථිර ලිපිනය..........................................................................................................

...........................විද්‍යුත් තැපැල(e-mail)......................................... දුරකථන අංකය...................................................

8. දිස්ත්‍රික්කය....................... 9. විවාහක / අවිවාහක බව.......................................................................

10.රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර.......................................................................................

(ඉංග්‍රිසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ............................................................................

11. කාර්යාලීය ලිපිනය හා දුරකථන විස්තර..............................................................................

12. ලිපි එවිය යුතු ලිපිනය......................................................................................................

13. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්

1.........................................................................................................

2.........................................................................................................

14. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර

1 .........................................................................................................

2 .........................................................................................................

3 .........................................................................................................

15. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇඳුම,හෘද රෝග,දියවැඩියාව,රුධිර පීඩනය,අපස්මාරය ) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර

.........................................................................................................

16. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද? ඔව්/නැත.

17. එවැනි මනසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර . .

.........................................................................................................

18. ඔබ විසින් සඳහන් කළයුතු මෙහිදී වැදගත්යැයි හැගෙන වෙනත් විස්තර හෝ යෝජනා /අදහස් තිබේනම් මෙහි

සඳහන් කරන්න .........................................................................................................

.........................................................................................................

මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.

දිනය..................... අයදුම්කරුගේ අත්සන..................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

සාමාජික අංකය..................................

තේරීම් කමිටුවේ තීරණය

.....................................
තේරීම් කමිටු සභාපති

.............................................
විධායක ලේකම්

දිනය.................

සැ.යු. ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශණ/වැඩමුළු/මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශණ ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම, හැඳුනුම්පත් සැපයීම, තැපල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිලධාරී මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු.1500/-ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය.(එය ඇතුළත්වීමේ ගාස්තුව රු.500/-හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500/-x2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදයම් ලබන පවුල්වල අය තම ආදයම් තහවුරුකළ හැකි ලිපි ලේඛන (උදා:- තම විහාරස්ථානයේ නායක ස්වාමින්වහන්සේගේ නිර්දේශය.) සහිත ග්‍රාම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ.) කාර්යාලය සඳුද, අගහරුවාද හැර සතියේ ඉතිරි දින 5 තුල සෙනසුරාද, ඉරිද ද ඇතුලුව සතියේ දින 5ක් විවෘතව පවති. අයදුම් කරන සැමකෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍ය නම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය.

නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ජායාපිටපතක් සහ 4"x 9" ප්‍රමාණයෙන් යුතුව තම ලිපිනය ලියූ ස්මුද්දරකවර 2 ක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් පමණක් යොමු කරන්න. (අයදුම්පත සමග කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ)


ලිපිනය-ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 6. දුරකථනය 011-2505088 0714-014467

# පිංපොතෙන් බිඳක් ........





2010 ජනවාරි 01 දින ගංගාරාමයේදී වසරේ ප්‍රථම දානය පිරිනැමීම









හම්බන්තෝට දිස්ත්‍රික්කයේ අතිදුෂ්කර පාසලක් වන සූරියවලාන විදුහලේ පරිගනක විද්‍යාගාරයක් තැනීම සඳහා පරිගනක 4 ක් පරිත්‍යාගය කරන ලද සාමාජිකයින්ට අපගේ ආශිර්වාදය. සහ ඔවුන්ගේ මියගිය ඥාතීන්වෙත පිං අනුමෝදනාව.



සූරියවලාන විදුහල් සිසුන්




සක්මන් භාවනාවේ යෙදෙන 17 වන කණ්ඩායමේ පිරිස

# ත්‍රෛමාසික දාන-සීල-භාවනා වැඩසටහන 2010-01-03 සල්ගල භාවනා මධ්‍යස්ථානය.















සල්ගල භාවනා මධ්‍යස්ථානයේ බුදුමැදුර ප්‍රතිසංස්කරණය සඳහා සාමාජිකයන් විසින් රු. 60,000.00 ක මුදලක් ද. භාවනා මධ්‍යස්ථානයට අත්‍යාවශ්‍යව තිබු පාලාස්ටික් පුටු 60 ක් සාමාජික ජනක සුවඳරත්න මහතා විසින් ද, භාවනා මධ්‍යස්ථානයට අත්‍යාවශ්‍යය සෙසු පිරිකර විශාල ප්‍රමාණයක් සහභාගිවු සාමාජිකයින් විසින් ද මෙදින පූජා කරන ලදී.

# දක්ඛිණ විභංගය

1 වේලාම බ්‍රාහ්මණයාගේ දානය. ❋

- රිදියෙන් පිරවූ 84,000 ක් **රන් පාත්‍ර**
- රනින් පිරවූ 84,000 ක් **රිදී පාත්‍ර**
- අමුරනින් පිරවූ 84,000 ක් **කස්ලෝ පාත්‍ර**
- ස්වර්ණාලඞකාර ඇති රන් දද ඇති රන්රසු දැලින් ගැවසුණු 84,000 ක් **ඇතුන්**
- සිංහ සම්, ව්‍යාඝ්‍ර සම්, දිවි සම්, පඬු ඇඹුල් ඇතිරූ රනින් අලංකාර කල රන් දද ඇති රන්රසු දැලින් ගැවසුනු 84,000 ක් **රිය**
- දුහුල් රෙදි ඇතිරූ කස්ලෝ කොසු ඇති 84,000 ක් **දෙනුන්**
- මිණි කොඬොල් පැළඳි 84,000 ක් **කන්‍යාවන්**
- කොඳුපළස්, සුදු ඇතිරි, ඝන පුප් එළුලොම් ඇතිරි අතුළ කෙසෙල් මුව සමින් කල උතුම් පසතුරුණු ඇති උඩුවියන් සහිත දෙපසතැබූ කණ්වයින් ඇති 84,000 ක් **පළඟ**
- සියුම් කොමු පිළි, කොසෙය්‍ය පිළි, කම්බිලි, කපු පිළි කෝටි 84,000 ක් **වස්ත්‍ර**
- නදී මෙන් ගලන **අන්නපාන, ඛාද්‍ය, භෝජ්‍ය, ලෙහ්‍ය පෙය**

2 එක් සෝවාන් වහන්සේනමක් වැළඳවීම. ⟶ *වේලාම බ්‍රාහ්මණයාගේ දානයට වඩා මහත්ඵලයි.*

3 එක් සකෘදාගාමීන් වහන්සේනමක් වැළඳවීම. ⟶ *සෝවාන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

4 එක් අනාගාමී වහන්සේනමක් වැළඳවීම. ⟶ *සකෘදාගාමීන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

5 එක් රහතන් වහන්සේනමක් වැළඳවීම. ⟶ *අනාගාමීන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

6 එක් පසේබුදුන් වහන්සේනමක් වැළඳවීම. ⟶ *රහතන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

7 එක් සම්මා සම්බුදුන් වහන්සේනමක් වැළඳවීම. ⟶ *පසේබුදුන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

8 සම්මා සම්බුදුන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු සංඝයා වැළඳවීම. ⟶ *සම්මා සම්බුදුන්වහන්සේ වැළඳවීමට වඩා මහත්ඵලයි.*

9 සිව් දිග්හි භික්ෂූන් වහන්සේලා උදෙසා වෙහෙරක් කරවීම. ⟶ *ඉහත දානයට වඩා මහත්ඵලයි.*

10 පහන් සිතින් තිසරණ සරණයාම. ⟶ *ඉහත දානයට වඩා මහත්ඵලයි.*

11 පහන් සිතින් පංචශිල ශික්ෂා පද සමාදම් වීම. ⟶ *ඉහත පුණ්‍යකර්මයට වඩා මහත්ඵලයි.*

12 ගඳක් සිඹිනා කාලයක් මෛත්‍රිය වැඩීම. ⟶ *ඉහත පුණ්‍යකර්මයට වඩා මහත්ඵලයි.*

13 අසුරක් ගසනා කාලයක් අනිත්‍ය මෙනෙහි කිරීම. ⟶ *ඉහත පුණ්‍යකර්මයට වඩා මහත්ඵලයි.*

## පුද්ගලික වශයෙන් දියහැකි දානයන්

1. තිරිසනුන් විෂයෙහි ⟶ *සියක් අනුසස් ඇති දක්ෂිණායෙක්* ✪
2. පෘථග්ජන දුසිල්වතුන් විෂයෙහි ⟶ *දහස් අනුසස් ඇති දක්ෂිණායෙක්*
3. පෘථග්ජන සිල්වතුන් විෂයෙහි ⟶ *සිය දහසක් අනුසස් ඇති දක්ෂිණායෙක්*
4. කාමයෙහි වීතරාගී වූ බාහිරක තාපසයන් විෂයෙහි ⟶ *කෙළ ලක්ෂයක් අනුසස් ඇති දක්ෂිණායෙක්*
5. සෝවාන් ඵල පසක් කරගන්නට පිළිපන් තථාගත ශ්‍රාවකයා විෂයෙහි ⟶ *අසඞ්ඛෙය අනුසස් ඇති දක්ෂිණායෙක්*
6. සෝවාන් තථාගත ශ්‍රාවකයා විෂයෙහි ⟶ *අනන්ත අප්‍රමාණ අනුසස් ඇති දක්ෂිණායෙක් (කවර කථාද)*
7. සකෘදාගාමී ඵල පසක් කරගන්නට පිළිපන් තථාගත ශ්‍රාවකයා විෂයෙහි ⟶ "
8. සකෘදාගාමී තථාගත ශ්‍රාවකයා විෂයෙහි ⟶ "
9. අනාගාමී ඵල පසක් කරගන්නට පිළිපන් තථාගත ශ්‍රාවකයා විෂයෙහි ⟶ "
10. අනාගාමී තථාගත ශ්‍රාවකයා විෂයෙහි ⟶ "
11. රහත්ඵල පසක් කරගන්නට පිළිපන් තථාගත ශ්‍රාවකයා විෂයෙහි ⟶ "
12. අර්හත් තථාගත ශ්‍රාවකයා විෂයෙහි ⟶ "
13. ප්‍රත්‍යෙක සම්බුද්ධයන් විෂයෙහි ⟶ "
14. අර්හත් තථාගත සම්‍යක් සම්බුද්ධයන් විෂයෙහි ⟶ "

## සාංඝික වශයෙන් දියහැකි දානයන්

1. තථාගතයන් වහන්සේ ප්‍රමුඛ උභතො සංඝයා විෂයෙහි
2. තථාගතයන් වහන්සේ පිරිනිවීකල උභතො සංඝයා විෂයෙහි
3. භික්ෂු සංඝයා විෂයෙහි
4. භික්ෂුණී සංඝයා විෂයෙහි
5. ප්‍රමාණ වශයෙන් භික්ෂු සහ භික්ෂුණී සංඝයා විෂයෙහි
6. ප්‍රමාණ වශයෙන් භික්ෂු සංඝයා විෂයෙහි
7. ප්‍රමාණ වශයෙන් භික්ෂුණී සංඝයා විෂයෙහි


මූලාශ්‍ර - 2500 බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව

❋ අංගුත්තරනිකාය - 9.1.2.10 - වේලාම සූත්‍රය (පි.435)

✪ මජ්ඣිමනිකාය - 3.4.12 - දක්ඛිණවිභංග සූත්‍රය (පි.521)

✱ අංගුත්තරනිකාය - 8.1.4.7 - සප්පුරිස දාන සූත්‍රය (පි.165)

◈ අංගුත්තරනිකාය - 8.1.4.1 - දාන සූත්‍රය (පි.151)


### සත්පුරුෂ දානය ✱

1. පිරිසිදු දෑ දෙයි.
2. ප්‍රණීත දෑ දෙයි.
3. සුදුසු කල්හි දෙයි.
4. කැපවූවක් දෙයි.
5. පරීක්ෂාකොට දෙයි.
6. නිරතුරු දෙයි.
7. පහන් සිතින් දෙයි.
8. දුන්පසු සතුටු වෙයි.

### අසත්පුරුෂ දානය ❋

රූක්ෂ හෝ ප්‍රණීත හෝ වේවා,
සකස් නොකොට දීම,
ගරු නොකොට දීම,
සියතින් නොදීම,
නිරතුරු නොදීම,
කම්ඵල අදහා නොදීම,

හේතුවෙන් එම දානයේ විපාක පහලවූවිට උදාර භෝජනය පිණිස, වස්ත්‍ර දැරීම, වාහන පරිහරණය පස්කම් ගුණයෙහි භෝගය පිණිස හිත නොනැමෙයි. ඔහුගේ පුත්‍රයන්, අඹුවන්, දාසයන්, මෙහෙකරු වහලුන්, කම්කරුවන්, ඔහුගේ වචන අසනු නොකැමති වෙයි. සවන් නොදෙයි.

### දාන විශුද්ධීන්ගේ ප්‍රභේද ✪

1. දුස්සීල ප්‍රතිග්‍රාහකයාට සිල්වත් දායකයා දෙන දානය - විශුද්ධ වේ.
2. සිල්වත් ප්‍රතිග්‍රාහකයාට දුස්සීල දායකයා දෙන දානය - විශුද්ධ වේ.
3. දුස්සීල ප්‍රතිග්‍රාහකයාට දුස්සීල දායකයා දෙන දානය - විශුද්ධ නොවේ.
4. සිල්වත් ප්‍රතිග්‍රාහකයාට සිල්වත් දායකයා දෙන දානය - විශුද්ධ වේ.

### දාන හේතු ◈

1. වෙතට පැමිණ දෙයි.
2. බියෙන් දෙයි.
3. මට දුන්නේයැයි සිතා දෙයි.
4. මට දෙන්නේයැයි සිතා දෙයි.
5. දීම මැනව යැයි සිතා දෙයි.
6. මම පිසමි,මොවුහු නොපිසත්, ඒ නිසා දියයුතුයැයි සිතා දෙයි.
7. මේ දානය නිසා උපන් කීර්තියක් ලැබේ යැයි දෙයි.
8. සිතෙහි අලංකාරය පිණිස දෙයි.

# සක්වල විභංගය

## එක් සම්මා සම්බුදුවරයකුගේ ආඥා ක්ෂේත්‍රයකට මෙවැනි සක්වල කෝටි ලක්ෂයක් අයත්වේ

| ලෝකය | භූමිය | යොදුන් | මුළු ආයුෂ (මනුෂ්‍ය වර්ෂ) | දිනකට මනුෂ්‍ය වර්ෂ | ආයුෂ | මහා කල්ප විනාශය |
|---|---|---|---|---|---|---|
| අරූපාවචර බ්‍රහ්ම ලෝක | නෙවසඤ්ඤානාසඤ්ඤායතනය | 5,580,000 යොදුන් | 84,000 මහා කල්ප | | | |
| | ආකිඤ්චඤ්ඤායතනය | 5,580,000 යොදුන් | 60,000 මහා කල්ප | | | |
| | විඤ්ඤාණඤ්චායතනය | 5,580,000 යොදුන් | 40,000 මහා කල්ප | | | |
| | ආකාසානඤ්චායතනය | 5,580,000 යොදුන් | 20,000 මහා කල්ප | | | |
| ශුද්ධාවාස බ්‍රහ්ම ලෝක | අකණිට්ඨ | 5,508,000 යොදුන් | 16,000 මහා කල්ප | | | |
| | සුදස්සී | 5,508,000 යොදුන් | 8,000 මහා කල්ප | | | |
| | සුදස්ස | 5,508,000 යොදුන් | 4,000 මහා කල්ප | | | |
| | අතප්ප | 5,508,000 යොදුන් | 2,000 මහා කල්ප | | | |
| | අවිහ | 5,508,000 යොදුන් | 1,000 මහා කල්ප | | | |
| රූපාවචර බ්‍රහ්ම ලෝක | වේහප්ඵල , අසංඥසත්වය (චතුර්ථ ධ්‍යාන භූමි) | 5,508,000 යොදුන් | 500 මහා කල්ප | | | |
| | පරිත්ත සුභ , අප්පමාණ සුභ , සුභකිණ්හ (තෘතීක ධ්‍යාන භූමි) | 5,508,000 යොදුන් | 16 මහා කල්ප<br>32 මහා කල්ප<br>63 මහා කල්ප 1 අසංඛ්‍ය කල්ප | | | වාතයෙන් 1 වරක් මෙතැනින් පහලට සියළුම ලෝක |
| | පරිත්තාභ , අප්පමාණාභ , ආභස්සර (ද්විතීක ධ්‍යාන භූමි) | 5,508,000 යොදුන් | 2 මහා කල්ප<br>4 මහා කල්ප<br>7 මහා කල්ප 1 අසංඛ්‍ය කල්ප | | | ජලයෙන් 1 වරක් මෙතැනින් පහලට සියළුම ලෝක |
| | බ්‍රහ්මපාරිසජ්ජය , බ්‍රහ්මපුරෝහිත , මහාබ්‍රහ්මය (ප්‍රථම ධ්‍යාන භූමි) | 5,508,000 යොදුන් | 1/3 අසංඛ්‍ය කල්ප<br>1/2 අසංඛ්‍ය කල්ප<br>1 අසංඛ්‍ය කල්ප | | | ගින්නෙන් 7 වරක් මෙතැනින් පහලට සියළුම ලෝක |
| දිව්‍ය ලෝක | පරනිම්මිත වසවර්තිය | 42,000 යොදුන් | 9,216,000,000 අවුරුදු | 1,600 | 16,000 | |
| | නිම්මාණරතිය | 42,000 යොදුන් | 2,304,000,000 අවුරුදු | 800 | 8,000 | |
| | තුසිතය | 42,000 යොදුන් | 576,000,000 අවුරුදු | 400 | 4,000 | |
| | යාමය | 42,000 යොදුන් | 144,000,000 අවුරුදු | 200 | 2,000 | |
| | තාවතිංසය | 42,000 යොදුන් | 36,000,000 අවුරුදු | 100 | 1,000 | |
| | චාතුම්මහාරාජිකය | 42,000 යොදුන් | 9,000,000 අවුරුදු | 50 | 500 | |
| | මනුස්ස | 15,000 යොදුන් | 10 - $10^{140}$ අවුරුදු | | | |
| නිරය ලෝක (සතර අපායන් අතුරින් එක් අපායක්) | සංජීවය | 15,000 යොදුන් | 162,000,000,000 අවුරුදු | 900,000 | 500 | |
| | කාල සූත්‍රය | 15,000 යොදුන් | 1,296,000,000,000 අවුරුදු | 3,600,000 | 1,000 | |
| | සංඝාතය | 15,000 යොදුන් | 10,368,000,000,000 අවුරුදු | 14,400,000 | 2,000 | |
| | රෞරවය | 15,000 යොදුන් | 82,944,000,000,000 අවුරුදු | 57,600,000 | 4,000 | |
| | මහා රෞරවය | 15,000 යොදුන් | 663,552,000,000,000 අවුරුදු | 230,400,000 | 8,000 | |
| | තාපය | 15,000 යොදුන් | 5,308,416,000,000,000 අවුරුදු | 921,600,000 | 16,000 | |
| | මහා තාපය | 15,000 යොදුන් | 1/2 අන්තඃ කල්ප | | 32,000 | |
| | අවීචිය | | 1 අන්තඃ කල්ප | | 64,000 | |

ඔසුපත් නිරයත් 128 (කුඩා)